# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2294/59 – 2022 අගෝස්තු 26 වැනි සිකුරාදා – 2022.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩ්ඩුක්කුලම් පත්තු සුළු කොට්ඨාසයේ, පුලියන්කුලම්, කොට්ඨාස අංක 2431 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පුලියන්කුලම් ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Tri/TWG/2017/224 හා 2018.05.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පනන්කාඩු, තෙට්සනාමූතිමඩම්කාඩු, තෙන්නම්තොටකාඩු සහ මුතිලිංගන්තොටකාඩු – ප්‍රමාණය: හෙක්. 12.4705 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර C; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.); දකුණට: පුලවුතරි සහ මුතිලිංගන්තොටකාඩු; බටහිරට: කැබලි අක්ෂර B.

02. **කැබලි අක්ෂර 'B' – ප්‍රමාණය: හෙක්. 0.2044 ක් පමණ**

උතුරට: පනන්කාඩු, කැබලි අක්ෂර C සහ A; නැගෙනහිරට: මුතිලිංගන්තොටකාඩු; දකුණට: මුතිලිංගන්තොටකාඩු සහ තට්ටක්කයිකාඩු; බටහිරට: තට්ටක්කයිකාඩු.

03. **කැබලි අක්ෂර 'C' – ප්‍රමාණය: හෙක්. 0.3373 ක් පමණ**

උතුරට: පනන්කාඩු, පුලියන්කුලම් සහ පුලවුතරි; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර A; දකුණට: කැබලි අක්ෂර A සහ B; බටහිරට: කැබලි අක්ෂර B, පනන්කාඩු, පුලියන්කුලම් සහ පුලවුතරි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2014/VE/162.
2022 ජූලි මස 27 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 08 – 0257